# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 6 දරන
# සිවිල් නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි

# 1990 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 15/88.

## සිවිල් නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 101 වන අධිකාරය වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 14අ වන වගන්තිය ලෙස බල පවත්වනනේ ය :— *101 වන අධිකාරයෙහි 14අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"යම් සන්තකයක් ලබාගැනීම සඳහා අයිතියක් ක්‍රියාත්මක කළ හැකි යයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා මියගිය සහ ඒ සන්තකය ලබා ගැනීම සඳහා නඩු පැවරීමේ අයිතිය දිගටම පවත්නා අවස්ථාවක, ආදේශ කිරීම.*

14අ. (1) යම් සන්තකයක් ලබාගැනීම සඳහා අයිතියක් ක්‍රියාත්මක කළ හැකි යයි කියනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා මිය ගිය සහ ඒ සන්තකය ලබාගැනීම සඳහා නඩු පැවරීමේ අයිතිය දිගට ම පවතින අවස්ථාවක, ඒ අයිතිය යම් තැනැත්තකුට ඇතැයි කියනු ලබන්නේ ද ඒ තැනැත්තා විසින්, දිවුරුම් ප්‍රකාශයකින් සනාථ කරන ලද, ඉල්ලීමක් ලඝු නඩු කාර්ය පටිපාටිය මගින්, තත් කාර්යය සඳහා නඩුවක් පවරනු ලැබිය හැකි අධිකරණය වෙත පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකි ය :—

(අ) ඒ තැනැත්තා බූදලයක් ඉතිරි කොට, අන්තිම කැමැති පත්‍රයක් නොතබා මිය ගිය අවස්ථාවක, 394(2) වන වගන්තියේ අර්ථකථනය කරනු ලැබ ඇති පරිදි, ඒ මියගිය තැනැත්තාගේ නීත්‍යනුකූල නියෝජිතයා යයි ඒ නඩුව පැවරීමට අයිතිය ඇති තැනැත්තා විසින් කියනු ලබන්නා වූ ද මියගිය තැනැත්තා වෙනුවට යෝජිත නඩුවේ දී විත්තිකරු කිරීමට ඔහු අදහස් කරන්නා වූ ද යම් තැනැත්තකුගේ නම, විස්තරය සහ පදිංචි ස්ථානය දක්වමින් ඉදිරිපත් කළ යුතු ය. මියගිය තැනැත්තාගේ සෙසු උරුමකරු හෝ උරුමකරුවන් හෝ යයි ඉල්ලුම්කරු කියා සිටින තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ද, විස්තර ද, පදිංචි ස්ථානය හෝ ස්ථාන ද, එම ඉල්ලීමෙහි දැක්විය යුතු ය.

(ආ) මියගිය තැනැත්තාගේ බූදලයට අදාළව අන්තිම කැමැති පත්‍රයේ ප්‍රොබේට් සිට පත්‍රය, හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය

—ඩී ○ 07510—6,200 (89/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

හෝ නිකුත් කර නොමැති හෝ නිකුත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වීමට ඉඩ ඇති අවස්ථාවක මියගිය තැනැත්තාගේ බූදලයට අදාළව අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබනු ඇතැයි පැමිණිලිකරු විසින් කියනු ලබන්නා වූ ද, මියගිය තැනැත්තා වෙනුවට යෝජිත නඩුවේ දී විත්තිකරු කිරීමට ඔහු අදහස් කරන්නා වූ ද යම් තැනැත්තකුගේ නම, විස්තරය සහ පදිංචි ස්ථානය දක්වමින්, ඉදිරිපත් කළ යුතු ය. මියගිය තැනැත්තා හෝ සෙසු උරුමකරු හෝ උරුමකරුවන් හෝ යයි ඉල්ලුම්කරු කියා සිටින තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ද, විස්තර ද, පදිංචි ස්ථානය හෝ ස්ථාන ද එම ඉල්ලීමෙහි දක්වා තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, නඩු කාර්යය සඳහා හේතු ඇතැයි අධිකරණය හැඟීමට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින්, එම ඉල්ලීමෙහි නම් කරනු ලැබ ඇති නියෝජිතයා වෙත සහ වෙනත් තැනැත්තන් සිටී නම්, ඒ තැනැත්තන් වෙත දැන්වීම් නිකුත් කිරීමෙන් පසුව සහ (පළමු වන උපලේඛනයේ අංක 2අ වන ආකෘතියෙහි) එම ඉල්ලීම පිළිබඳ දැන්වීම, අධිකරණය විසින් තෝරා ගනු ලබන දේශීය පුවත්පතක ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු හෝ ඒ පළ කිරීම වෙනුවට ප්‍රමාණවත් යයි අධිකරණය සලකන වෙනත් දැන්වීම් මාධ්‍යයකින් හෝ ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුව සහ අවශ්‍ය යයි අධිකරණය සලකන විභාගයකින් පසුව සහ සුදුසු යයි අධිකරණය සලකන නියමයන් මත, සුදුසු යයි අධිකරණය සලකන නියෝජිතයා හෝ වෙනත් තැනැත්තා, එම නඩුව පැවරීම සඳහා, මියගිය තැනැත්තා වෙනුවට පත් කරනු ලබන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද තමා මියගිය තැනැත්තාගේ නීත්‍යනුකූල නියෝජිතයා නොවන බවට හෝ, තමා මියගිය තැනැත්තා වෙනුවට පත් කරනු නොලැබිය යුතු බවට, මියගිය තැනැත්තා වෙනුවට එසේ පත් කරනු ලබන තැනැත්තා විසින්, විරෝධය පානු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයේ

ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ නිකුත් කර නොමැති බවට හෝ නිකුත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද විය හැකි බවට, අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක සහ අධිකරණය විසින් මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයෙහි ප්‍රොබේට් බලපත්‍රය හෝ, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා ලෙස, එම ඉල්ලීමෙහි දක්වා ඇති තැනැත්තා සහ වෙනත් යම් තැනැත්තන් වේ නම් ඒ තැනැත්තන් වෙත දැන්වීම නිකුත් කිරීමෙන් පසුව සහ (පළමුවන උපලේඛනයේ අංක 2අ දරන ආකෘතියෙහි) එම ඉල්ලීම පිළිබඳ දැන්වීම අධිකරණය විසින් තෝරා ගනු ලබන දේශීය පුවත්පතක ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් හෝ ඒ ප්‍රසිද්ධ කිරීම වෙනුවට, ප්‍රමාණවත් යයි අධිකරණය සලකන වෙනත් දැන්වීම් මාධ්‍යයකින් හෝ ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුව සහ අවශ්‍ය යයි අධිකරණය සලකන විභාගයකින් පසුව සහ සුදුසු යයි අධිකරණය සලකන නියමයක් මත මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා ලෙස අධිකරණයට පෙනී යන තැනැත්තා, එම නඩුව පැවරීම සඳහා මියගිය තැනැත්තා වෙනුවට පත් කරන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයෙහි ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා තමා නොවනු බවට හෝ මියගිය තැනැත්තා වෙනුවට තමා පත් නොකළ යුතු බවට හෝ එසේ පත් කරනු ලබන තැනැත්තා විසින් විරෝධය පානු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියෙහි සහ (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද—

(අ) නඩුව පැවරීම ප්‍රමාද වීමෙන්, කාලාවරෝධ ආඥාපනතේ විධිවිධාන හේතු කොට ගෙන, එම නඩුව පවත්වා ගෙන යාමට නොහැකි විය හැකි බවට අධිකරණය සෑහීමට පත් වී ඇති අවස්ථාවක; හෝ

(ආ) මියගිය තැනැත්තාගේ මරණයෙන් පසු, මාස හයක කාල සීමාවක් ඉකුත් වී ඇති අවස්ථාවක

පමණක්, මෙකී උපවගන්ති අතුරෙන් යම් උපවගන්තියක් යටතේ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) මියගිය තැනැත්තා වෙනුවට නියෝජිතයකු පත් කිරීමේ ආඥාවක් (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ කරනු ලැබීමෙන් සහ මියගිය තැනැත්තා වෙනුවට එම තැනැත්තාට විරුද්ධව නඩුවක් පවරනු ලැබීමෙන් පසුව, මේ සංග්‍රහයේ XXXVIII වන පරිච්ඡේදය යටතේ පවරන ලද නඩු කටයුතුවල දී, අවස්ථෝචිත පරිදි අන්තිම කැමැති පත්‍රයේ පොල්මාකරුවකු හෝ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබුවහොත්, එම නඩුවේ පැමිණිලිකරු හෝ වෙනත් යම් පාර්ශ්වකරුවකු විසින් හෝ, එම පොල්මාකරු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරමින්, ලඝු කාර්ය පරිපාටිය මගින් වූ ඉල්ලීමක් කරනු ලැබූ විට, (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ පත් කරන ලද තැනැත්තා වෙනුවට ඒ පොල්මාකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු ආදේශ කරනු ලැබිය යුතු අතර, එවිට, එම පොල්මාකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු මුලින් ම විත්තිකරුවකු කරනු ලැබ සිටියාක් මෙන් ද නඩුවේ කලින් වූ නඩු කටයුතුවලදී ඔහු පාර්ශ්වකරුවකු ව සිටියාක් මෙන් ද නඩුව ඒ ආකාරයෙන් ම ඉදිරියට පවත්වා ගෙන යා යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 192 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 192 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ මුදල් සඳහා පොලිය තීන්දු ප්‍රකාශ කළ යුත්තේ කිනම් අනුප්‍රමාණයක් මත ද යන වග.

192. (1) පැමිණිලිකරුට ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් සඳහා නඩුව පවරනු ලැබ ඇති විට, නඩුව පවරන ලද්දේ යම් සාධන පත්‍රයක් මත ද, පාර්ශ්වකරුවන් ඒ සාධන පත්‍රයෙන් එකඟ වී ඇති අනුප්‍රමාණයන් අනුව හෝ, එවැනි යම් ගිවිසුමක් නොමැති විට මුල් විනිශ්චිත මුදල මත, නඩුවේ දිනයෙහි සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් නීත්‍යානුකූල අනුප්‍රමාණය මත ගෙවිය යුතු පොලිය ද ඊට අමතරව නඩුව පැවරීමට පූර්ව යම් කාල සීමාවක් සඳහා මුල් මුදල සඳහා විනිශ්චිත යම් පොලියක් ද තීන්දු ප්‍රකාශයේ දින සිට මුදල ගෙවන දිනය දක්වා හෝ සුදුසු යයි අධිකරණය අදහස් කරන ඊට කලින් දිනයක් දක්වා, එසේ විනිශ්චිත සම්පූර්ණ මුදල සඳහා සුදුසු යයි අධිකරණය අදහස් කරන අනුප්‍රමාණයක් මත වැඩිදුර පොලියක් ද ගෙවන ලෙස අධිකරණය විසින් තීන්දු ප්‍රකාශයෙන් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, “නීත්‍යානුකූල අනුප්‍රමාණය” යන්නෙන්. තත් කාලයෙහි පවත්නා බැංකු පොලී ප්‍රමාණයන් ගැන සැලකිලි

මත්‍ර ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, මුදල් මණ්ඩල පනතෙන් පිහිටුවනු ලැබූ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වාණිජ්‍ය ඩියසට ප්‍රමාණය අදහස් වේ.

(3) තීන්දු ප්‍රකාශයේ දිනයෙහි සිට, ගෙවීම කරන දිනය දක්වා හෝ වෙනත් කලින් දිනයක් දක්වා, ඉහත කී පරිදි ඒ සම්පූර්ණ මුදල සඳහා වැඩිදුර පොලියක් ගෙවීම පිළිබඳව තීන්දු ප්‍රකාශයෙහි කිසිවක් සඳහන් වී නොමැති අවස්ථාවක, අධිකරණය ඒ පොලිය ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ නිසා ඒ පොලිය අය කර ගැනීම සඳහා වෙනම නඩුවක් ද පැවරිය නොහැකි වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 398 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 398 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා ආදේශ කිරීම.

398. (1) විත්තිකරුවන් එක් කෙනෙකුට වඩා වැඩි ගණනක් සිට තීන්දු ප්‍රකාශයට පෙර ඔවුන් ගෙන් යම් කෙනෙකු මියගොස්, ජීවත්ව සිටින විත්තිකරුට හෝ විත්තිකරුවන්ට හෝ පමණක් විරුද්ධව ඒ නඩු නිමිත්ත මත නඩු පැවරීමේ අයිතිවාසිකම නොපවතී නම් සහ එකම විත්තිකරු හෝ ජීවත්ව සිටින එකම විත්තිකරු මියගොස් නඩු පැවරීමේ අයිතිවාසිකම නො පවතී නම්—

(අ) මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා යයි පැමිණිලිකරු විසින් කියනු ලබන්නා වූ ද මියගිය විත්තිකරු වෙනුවට ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා කිරීමට ඔහු අදහස් කරන්නා වූ ද යම් තැනැත්තකුගේ නම, විස්තරය සහ පදිංචි ස්ථානය සඳහන් කරමින්, දිවුරුම් පත්‍රයකින් සනාථ කරන ලද ඉල්ලීමක් ලඝු කාර්ය පටිපාටිය මගින් අධිකරණය වෙත පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ හැකිය ; නැතහොත්

(ආ) මියගිය විත්තිකරුගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ නිකුත් කර නොමැති හෝ එසේ නිකුත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වීමට ඉඩ ඇති අවස්ථාවක, මියගිය විත්තිකරුගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන

තැනැත්තා යයි පැමිණිලිකරු කියා සිටින්නා වූ ද, මියගිය විත්තිකරු වෙනුවට නියෝජිතයා, කිරීමට ඔහු අදහස් කරන්නා වූ ද යම් තැනැත්තකුගේ නම, විස්තරය සහ පදිංචි ස්ථානය නිශ්චය කොට දක්වමින් දිවුරුම් පෙත්සමකින් සනාථ කරන ලද ඉල්ලීමක්, ලඝු කාර්ය පටිපාටිය මගින් අධිකරණය වෙත පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ හැකිය. මියගිය තැනැත්තාගේ උරුමකරු යයි හෝ උරුමකරුවන් යයි හෝ පැමිණිලිකරු විසින් කියා සිටිනු ලබන තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම්, විස්තර සහ පදිංචි ස්ථාන ද එම ඉල්ලීමෙහි සඳහන් කළ යුතු ය; නැතහොත්

(ඇ) එම විත්තිකරු අන්තිම කැමති පත්‍රයක් ලියා නොතබා මියගොස් ඇති අවස්ථාවක, මියගිය තැනැත්තාගේ නීත්‍යනුකූල නියෝජිතයා යයි පැමිණිලිකරු විසින් කියනු ලබන්නා වූ ද, මියගිය විත්තිකරු වෙනුවට විත්තිකරු කිරීමට ඔහු අදහස් කරන්නා වූ ද යම් තැනැත්තකුගේ නම, විස්තරය සහ පදිංචි ස්ථානය සඳහන් කරමින් දිවුරුම් පෙත්සමකින් සනාථ කරන ලද ඉල්ලීමක්, ලඝු කාර්ය පටිපාටිය මගින් අධිකරණය වෙත පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ හැකි ය. මියගිය තැනැත්තාගේ උරුමකරු යයි හෝ උරුමකරුවන් යයි හෝ පැමිණිලිකරු කියා සිටින තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම් විස්තර සහ පදිංචි ස්ථාන ද එම ඉල්ලීමෙහි සඳහන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, තත් කාර්යය සඳහා හේතු තිබෙන බවට අධිකරණය සෑහීමට පත් වූ විට, අධිකරණය විසින් එම විත්තිකරු වෙනුවට, එම නියෝජිතයාගේ නම නඩු වාර්තාවෙහි ඇතුළත් කළ හැකි අතර, නඩුවෙහි විත්තිකවාචිකය ඉදිරිපත් කිරීමට සිතාසියේ සඳහන් දිනයක පෙනී සිටින ලෙසට (පළමු වන උපලේඛනයේ අංක 71 දරන ආකෘතියේ) සිතාසියක් එම නියෝජිතයා

වෙත නිකුත් කළ යුතු ය. එවිට එම නියෝජිතයා මුලින්ම විත්තිකරුවකු කරනු ලැබ සිටියාක් මෙන් ද නඩුවේ කලින් වූ නඩු කටයුතුවල දී ඔහු පාර්ශ්වකරුවකුව සිටියාක් මෙන් ද නඩුව ඒ ආකාරයෙන්ම තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යා යුතු ය :

එසේ වුවද, එසේ විත්තිකරු කරනු ලැබූ තැනැත්තා විසින්, තමා විත්තිකරුගේ නීත්‍යනුකූල නියෝජිතයා නොවන බව කියා සිටිමින් තම විරෝධය ඉදිරිපත් කළ හැකි ය. නැතහොත් එවැනි නියෝජිතයකු වශයෙන් තමා දරන තත්ත්වයට උචිත පරිදි යම් විත්තිවාචකයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ නිකුත් කර නොමැති බවට හෝ එය නිකුත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද විය හැකි බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින් මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයෙහි ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා යයි එම ඉල්ලීමෙහි දක්වා ඇති තැනැත්තා සහ වෙනත් යම් තැනැත්තන් වේ නම් ඒ තැනැත්තන් වෙත දැන්වීම නිකුත් කිරීමෙන් පසුව සහ (පළමුවන උපලේඛනයේ අංක 71අ ආකෘතියෙහි) එම ඉල්ලීම පිළිබඳ දැන්වීම අධිකරණය විසින් තෝරා ගනු ලබන දේශීය පුවත් පතක ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් හෝ එසේ ප්‍රසිද්ධ කිරීම වෙනුවට ප්‍රමාණවත් යයි අධිකරණය සලකන වෙනත් දැන්වීම් මාධ්‍යයකින් හෝ ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුව සහ අවශ්‍ය යයි අධිකරණය සලකන විභාගයකින් පසුව සහ සුදුසු යයි අධිකරණය සලකන නියමයන් මත, මියගිය තැනැත්තාගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයෙහි

ප්‍රොබේට් බලපත්‍රයේ හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා ලෙස අධිකරණයට පෙනී යන තැනැත්තා මියගිය විත්තිකරු වෙනුවට අධිකරණය විසින් නඩු වාර්තාවෙහි ඇතුළත් කළ යුතු ය. එවිට එම නියෝජිතයා මුලින්ම විත්තිකරුවකු කරනු ලැබ සිටියාක් මෙන් ද නඩුවේ කලින් වූ නඩු කටයුතු වල දී ඔහු පැමිණිලිකරුවකු ව සිටියාක් මෙන් ද නඩුව ඒ ආකාරයෙන් ම තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යා යුතු ය:

එසේ වුවද, මියගිය විත්තිකරුගේ මරණයෙන් හය මාසයක් ඉකුත් වීමෙන් පසුව පමණක් එවැනි ආඥාවක් කරනු ලැබිය යුතු අතර, එසේ විත්තිකරු කරනු ලැබූ තැනැත්තා විසින්, මියගිය විත්තිකරුගේ බූදලයට අදාළ අන්තිම කැමති පත්‍රයෙහි ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන තැනැත්තා තමා නොවන බවට හෝ මියගිය විත්තිකරු වෙනුවෙන් තමා විත්තිකරු නොකළ යුතු බවට හෝ විරෝධය පෑ හැකි අතර මියගිය විත්තිකරු වෙනුවට තමාගේ නම නඩු වාර්තාවෙහි ඇතුළත් කරනු ලැබූ විට, එවැනි නියෝජිතයකු වශයෙන් තමා දරන තත්ත්වයට උචිත පරිදි මියගිය විත්තිකරු වෙනුවෙන් යම් විත්තිවාචකයක් ඉදිරිපත් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, තත් කාර්යය සඳහා හේතු තිබෙන බවට අධිකරණය සෑහීමට පත් වූ විට, එම ඉල්ලීමෙහි නම් කර ඇති නියෝජිතයා වෙත සහ වෙනත් යම් තැනැත්තන් වේ නම්, ඒ තැනැත්තන් වෙත දැන්වීම නිකුත් කිරීමෙන් පසුව සහ (පළමුවන උපලේඛනයේ අංක 71අ වන ආකෘතියෙහි) එම ඉල්ලීම පිළිබඳ දැන්වීම අධිකරණය විසින් තෝරා ගනු ලබන දේශීය පුවත්පතක ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් හෝ, එසේ ප්‍රසිද්ධ කිරීම වෙනුවට, ප්‍රමාණවත් යයි අධිකරණය සලකන වෙනත් දැන්වීම් මාධ්‍යයකින් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුව, සහ අවශ්‍ය යයි අධිකරණය සලකන විභාගයකින් පසුව, සහ සුදුසු යයි අධිකරණය සලකන නියමයක් මත, එම නියෝජිතයාගේ හෝ අධිකරණය සුදුසු යයි සලකන වෙනත් තැනැත්තාගේ හෝ නම මියගිය විත්තිකරු වෙනුවට නඩු වාර්තාවෙහි

ඇතුළත් කරන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය. එවිට එම තැනැත්තා මුලින් ම විත්තිකරුවකු කරනු ලැබ සිටියාක් මෙන් ද නඩුවේ කලින් වූ නඩු කටයුතුවලදී පාර්ශ්වකරුවකුව සිටියාක් මෙන් ද නඩුව ඒ ආකාරයෙන් ම තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යා යුතු ය :

එසේ වුව ද මිය ගිය විත්තිකරුගේ මරණයෙන් හය මාසයක් ඉකුත් වීමෙන් පසුව පමණක් එවැනි ආඥාවක් කරනු ලැබිය යුතු අතර, එසේ විත්තිකරු කරනු ලැබූ තැනැත්තා විසින්, තමා මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා නොවන බවට හෝ මියගිය විත්තිකරු වෙනුවට තමා විත්තිකරු නොකළ යුතු බවට හෝ විරෝධය පෑ හැකි අතර මියගිය විත්තිකරු වෙනුවට තමාගේ නම නඩු වාර්තාවෙහි ඇතුළත් කරනු ලැබූ විට, එවැනි නියෝජිතයකු වශයෙන් තමා දරන තත්ත්වයට උචිත පරිදි මියගිය විත්තිකරු වෙනුවෙන් යම් විත්තිවාචකයක් ඉදිරිපත් කළ හැකි ය.

(5) මියගිය විත්තිකරුවකු වෙනුවට, තමා විත්තිකරුවකු කරන ලෙස නීත්‍යානුකූල නියෝජිතයා විසින් ඉල්ලා සිටිය හැකි ය. එම ඉල්ලීමට සහ ඒ ඉල්ලීමේ ප්‍රතිඵලය වන්නා වූ නඩු කටයුතුවලට මේ වගන්තියේ විධිවිධාන, අදාළ වන තාක් දුරට, ඒවා ඊට අදාළ වන්නේ ය.

(6) මේ වගන්තියේ (2) වන හෝ (3) හෝ උප වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබීමෙන් පසුව, මේ සංග්‍රහයේ XXXVIII වන පරිච්ඡේදය යටතේ නඩු කටයුතුවල දී පොල්මෑකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පත් කරනු ලබන අවස්ථාවක, නඩුවේ පැමිණිලිකරු විසින් හෝ වෙනත් යම් පාර්ශ්වකරුවකු විසින් හෝ එම පොල්මෑකරුම නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරුම විසින් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරමින්, ලඝු කාර්ය පටිපාටිය මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට, (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තා වෙනුවට ඒ පොල්මෑකරු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරු ආදේශ කරනු ලැබිය හැකි අතර, එවිට එම පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු මුලින් ම විත්තිකරුවකු කරනු ලැබ සිටියාක් මෙන් ද නඩුවේ කලින් වූ නඩු කටයුතුවල දී ඔහු පාර්ශ්වකරුවකුව සිටියාක් මෙන් ද නඩුව ඒ ආකාරයෙන් ම තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යා යුතු ය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 405 වන වගන්තියෙහි "398 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම" යන වචන වෙනුවට "398 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ ඉල්ලීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 405 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 705 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 705අ වන සහ 705ආ වන වගන්ති ලෙස බල පවත්වන්නේ ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 705 අ වන සහ 705 ආ වන වගන්ති ඇතුළත් කිරීම.

ලියාපදිංචි තැපෑලෙන් සිතාසි භාරදිය යුතු බව.

705අ. (1) සිතාසි සාමාන්‍ය වශයෙන් ලියාපදිංචි තැපෑලෙන් භාර දෙනු ලැබිය යුතු ය.

(2) (අ) සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, සිතාසි ලියාපදිංචි කාර්යාලය වෙත හෝ ලියාපදිංචි කාර්යාලයක් නොමැති නම් එම සංස්ථාවේ හෝ ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වෙත හෝ භාර දෙනු ලැබිය හැකිය ;

(ආ) විත්තිකරු රාජ්‍ය නිලධරයකු වන අවස්ථාවක, විත්තිකරු සේවයේ නියුක්තව සිටින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත අධිකරණය විසින් ලියාපදිංචි තැපෑලෙන් සිතාසි යවනු ලැබිය හැකි ය. එම සිතාසි විත්තිකරු වෙත පෞද්ගලිකව ම භාර දීමට සැලැස්වීම එම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ යුතුකම වන්නේ ය ;

(ඇ) විත්තිකරු වෙනත් යම් තැනැත්තකුගේ සේවයේ නියුක්තව සිටින බවට අධිකරණය බැලූ බැල්මට සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් සේවායෝජක වෙත ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානයට සිතාසි යවනු ලැබිය හැකි අතර, සේවායෝජකයා සමාගමක් හෝ සංස්ථාවක් වන අවස්ථාවක, එම සමාගමේ හෝ සංස්ථාවේ යම් ලේකම්වරයකු, කළමනාකරුවකු හෝ වෙනත් සමාන නිලධරයකු වෙත සිතාසි යවනු ලැබිය හැකි ය. එම සිතාසි විත්තිකරු වෙත පෞද්ගලිකවම භාරදීමට සැලැස්වීම, අවස්ථාවෝචිත පරිදි එම සේවායෝජකයාගේ හෝ නිලධරයාගේ හෝ යුතුකම වන්නේ ය.

(3) විත්තිකරු නොවන තැනැත්තකු වෙත ලියාපදිංචි තැපැලෙන් සිතාසි යවනු ලබන සෑම අවස්ථාවක ම, එම සිතාසියේ අනුපිටපතක් ද අධිකරණය විසින් ඉදිරිපත් කළ යුතු ය. තමාට සිතාසිය ලැබුණු බවට විත්තිකරු විසින් අනු පිටපතේ සටහනක් කර හෝ අධිකරණය විසින් සිතාසිය භාරදෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්ම සිතාසිය තමාට භාරදුන්නේ නම් මිස සිතාසිය භාරදෙන තැනැත්තා විසින් සිතාසිය භාරදෙන ලද බවට පිටසනක් එම අනුපිටපත මත යොදා, භාර දුන් තැනැත්තා විසින් අත්සන් තබා, සිතාසිය භාර දෙනු ලැබූ තැනැත්තා විසින් අනු අත්සන තබා, අනුපිටපත වහාම අධිකරණය වෙත ආපසු එවීම අවස්ථාවෝචිත පරිදි එම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ, සේවායෝජකයාගේ හෝ නිලධරයාගේ යුතුකම වන්නේ ය.

(4) ඉහත සඳහන් කර ඇති ආකාරයට තමා වෙත භාර දෙන ලද සිතාසි මත විත්තිකරු පුද්ගලිකව අධිකරණය ඉදිරියේ පෙනී සිටින අවස්ථාවක ඔහු විසින්, නම ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ඉදිරිපත් කළ යුතු ය. තමා ඉදිරියේ පෙනී සිටින තැනැත්තාත්, ඉහත සඳහන් ආකාරයට සිතාසි භාර දෙනු ලැබ ඇති තැනැත්තාත්, එකම තැනැත්තකු බවට විනිශ්චයකාරවරයා සෑහීමට පත්විය යුතු ය.

(5) ලියාපදිංචි නීතිඥවරයකු මගින් විත්තිකරු නියෝජනය කරනු ලබන අවස්ථාවක, විත්තිකරු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන පෙරලාසියෙහි විත්තිකරුගේ හැඳුනුම් පතෙහි හෝ ගමන් බලපත්‍රයෙහි හෝ අංකය නීතිඥවරයා විසින් සඳහන් කළ යුතු අතර, එම විත්තිකරුගේ අනන්‍යතාවය සහතික කරමින් ඒ මත පිටසනක් ද යෙදිය යුතු ය. සමාගමක් හෝ සංස්ථාවක් වෙනුවෙන් පෙරකලාසියක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, එය අවස්ථාවෝචිත පරිදි එම සමාගමේ හෝ සංස්ථාවේ මුද්‍රාව සහිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියෙහි—

" දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්න

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි, ශ්‍රී ලංකා නාවික හමුදාවෙහි හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි යම් ඒකකයක සාමාජිකයකු සම්බන්ධයෙන් යොදා ගනු ලබන විට, ඉන් ඒ ඒකක යේ අණදෙන නිලධරයා අදහස් වේ;

(ආ) පළාත් පාලන ආයතනයක සේව යේ නියුක්තව සිටින තැනැත් තකු සම්බන්ධයෙන් යොදා ගනු ලබන විට, එම පළාත් පාලන ආයතනය මහ නගර සභාවක් නම්, ඉන් ඒ සභාවේ නාගරික කොමසාරිස් අදහස් වේ; පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් හෝ නම්, ඒ නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ;

(ඇ) වෙනත් යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් යොදා ගනු ලබන විට, ඉන් එම තැනැත්තා සේවයේ නියුක්තව සිටින්නේ යම් දෙපාර්තමේන්තුවක ද ඒ දෙපාර්ත මේන්තුවේ ප්‍රධානියා අදහස් වේ.

" ජාතික හැඳුනුම්පත" යන්න යම් තැනැත් තකු සම්බන්ධයෙන් යොදා ගනු ලබන විට, ඉන් 1968 අංක 32 දරන පුද්ගල යන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ එම තැනැත්තා වෙත නිකුත් කරන ලද හැඳුනුම්පත අදහස් වේ.

පෞද්ගලිකව භාරදීම.

705ආ. (1) සිතාසි එසේ භාර දී තිබෙන නමුත් අධිකරණයේ පෙනී සිටීම විත්තිකරු පැහැර හැරි අවස්ථාවක, අධිකරණයේ යම් සිතාසි බෙදන්නකු මගින් එම සිතාසිය එම විත්තිකරු වෙත භාර දීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් හෝ පැමිණිලිකරු 1990 අංක 62 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අර්ථානුකූලව ණය දෙන ආයතනයක් වන අවස්ථාවක, පිස්කල් මාර්ගයෙන් හෝ අධිකරණය විසින් බලය දෙන ලද වෙනත් නිලධරයකු මාර්ගයෙන්, විත්තිකරු වෙත එම සිතාසි පුද්ගලිකව භාරදෙන ලෙස, අධිකරණය විසින් විධාන කළ යුතු ය. සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ලේකම්වරයා හෝ ඔහුට සමාන නිලධරයකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ එම සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තා හෝ වෙත භාර දීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන්, පෞද්ගලිකව භාර දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන වල සඳහන් ආකාරයට භාරදීම නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ ද කළ නොහැකි නම්, විත්තිකරු සාමාන්‍යයෙන් පදිංචිව සිටින නිවාසයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක හෝ සංස්ථාවක් නැතහොත් සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ සංස්ථාවේ පුද්ගල මණ්ඩලයේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානයේ හෝ කාර්යාලයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ඒ සිතාසිය පිස්කල් නිලධරයා විසින් හෝ ඒ වෙනත් බලයලත් නිලධරයා විසින් ඇලවිය යුතු ය. එවැනි සෑම අවස්ථාවක දී ම ඒ සිතාසිය විත්තිකරු වෙත යථා පරිදි භාර දෙන ලෙස සලකනු ලැබිය යුතු ය.".

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) අංක 2 ආකෘතියට ඉක්බිතිව ම එම උපලේඛනයේ 2අ වන ආකෘතිය ලෙස බල පැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් ආකෘති ඇතුළත් කිරීමෙන් :—

(14අ වන වගන්තිය)

" අංක 2අ

යෝජිත නඩුවක දී මියගිය විත්තිකරුවකු වෙනුවට විත්තිකරුවකු ලෙස නෑනෑත්තකු පත් කරන ලෙස වූ ඉල්ලීමක් පිළිබඳව දැන්වීමේ ආකෘතිය

..............................(හිමිකම් පෑමෙහි

.................................. වෙනුවට .................................. ට එරෙහිව ඉහත නම් සඳහන්.. .............................. (පැමිණිලිකරු) විසින් නඩු පවරනු ලැබීම පිණිස, මියගිය නෑනෑත්තා වන ........................ හි ........................ .......................... වෙනුවට ......................... හි .......................... ..........................පත් කළ යුතු යැයි අපේක්ෂා කරමින් ඉහත නම් සඳහන් .............................. (පැමිණිලිකරු) විසින් මේ අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් ;

එකී මියගිය නෑනෑත්තාගේ පොල්මෑකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු නැතහොත් උරුමකරුවකු වශයෙන් එකී මියගිය නෑනෑත්තාගේ දේපළ කෙරෙහි සම්බන්ධතාවක් දක්වන යම් නෑනෑත්තකු එවැනි ඉල්ලීමකට ඉඩ නොදීමට හේතු කිසිවක් ඇත් නම්, එම හේතු 19...... ක්වූ ............... මස ......... වන දින පෙරවරු/පස්වරු ............... ට මේ අධිකරණය ඉදිරියේ පෙනී සිට, දක්වා සිටිය යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

19...... ක්වූ .............. මස .............. වන දින දී ය.

අධිකරණයේ අණපරිදි,

රෙජිස්ට්‍රාර්. " ; තවද

(2) එම උපලේඛනයේ අංක 71 ආකෘතියට ඉක්බිතිව ම, 71අ වන ආකෘතිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන් :—

" අංක 71අ

(398 වන වගන්තිය)

මියගිය විත්තිකරුවකු වෙනුවට නෑනෑත්තකු පත් කරන ලෙසට ඉල්ලීමක් පිළිබඳ වූ දැන්වීමේ ආකෘතිය

ශීර්ෂය

පැමිණිලිකරු වශයෙන් ඉහත නම් සඳහන් ........... විසින්, දැනට මියගොස් ඇති ඉහත නම් සඳහන් ........................ ට එරෙහිව ඉහත සඳහන් නඩුව මේ අධිකරණයෙහි පවරා, ඒ මියගිය නෑනෑත්තා වෙනුවට...................... හි ..................විත්තිකරු කළ යුතු යැයි අපේක්ෂා කරමින්, මේ අධිකරණය වෙත ඉල්ලීමක් කර ඇති හෙයින්,

# 1930 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) 15 පනත

එකී මියගිය තැනැත්තාගේ පොල්මාකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු නැතහොත් උරුමක්කරුවකු වශයෙන්, එකී මියගිය තැනැත්තාගේ දේපළ කෙරෙහි උනන්දුවක් දක්වන යම් තැනැත්තකු එවැනි ඉල්ලීමකට ඉඩ නොදීමට හේතු කිසිවක් ඇත්නම්, එම හේතු 19......ක්වූ ......මස ...... වන දින පෙරවරු/පස්වරු......ට මේ අධිකරණය ඉදිරියේ පෙනී සිට, දක්වා සිටිය යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

19 ......... ක්වූ ......... මස ......... වන දින දීය.

අධිකරණයේ අණපරිදි,

රෙජිස්ට්‍රාර්. ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 177 යි. (විදේශීය) රු. 236 යි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව මළමෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.